සතිසංචින්තා

# තමිල් සෙල්වම් හා ජ.වි.පෙ. නායකත්වය



පසු ගිය සතියේ වැදගත් සිද්ධි දෙකක් සිදු විය. එකක් නම් දෙමළ විමුක්ති කොටි සංවිධානයේ දේශපාලන අංශ නායක තමිල් සෙල්වම් ශ්‍රී ලංකා ගුවන් හමුදාව විසින් ඝාතනය කිරීම යි. දෙවැන්න නම් උපාධිධාරීන් රැ වැට්ටවූ වළෙහි දවල් ද වැට්ටවීම යි.

1

උදය වරුවේ මම මගේ අධ්‍යයන මේසයේ වැඩ කරමින් සිටියෙමි. හදිසියේ ම හෙණ හඬක් වැනි හඬක් ඇසී මම ගැස්සී නැඟිට්ටෙමි. ඒ හඬ යළියළිත් ඇසෙන්ට විය. ඊළඟට රබන් ගසන හඬ ඇසිණ.

එළියට ඇවිත් බැලූ මට තමිල් සෙල්වම් ඝාතනය කර ඇතැයි නිවේදනය කර ඇති බව දැනගන්ට ලැබිණ.

රතිඤ්ඤා පත්තු කළේ ද රබන් ගැසුවේ ද දෙදහස් පන්සිය පනස් වසක් පැරණි නිර්මල ථේරවාද බුද්ධාගම් අදහන ශ්‍රද්ධා බුද්ධිසම්පන්න ආදර්ශවත් බෞද්ධ ජනයා ය.

තමිල් සෙල්වම් ගැන ඕනෑ දෙයක් සිතීමට හා ඕනෑ ම ආකල්පයක් දැරීමට ඕනෑ ම කෙනෙකුන්ට සපුරා ම අයිතිය ඇත.

එහෙත් සතුරා වුව මිය ගිය විට ඔකඳ වීමට බෞද්ධයන්ට අයිතියක් තිබේ ද? කවර ම ආගමිකයෙකුට හෝ අයිතියක් තිබේ ද?

බුදුදහම සකල සත්වයා වෙත මෛත්‍රිය පතුරුවන උතුම් දහමකි. දැන් මේ බෞද්ධ සාරධර්මය වනාන්තරගත වී ඇති බව මේ සිද්ධියෙන් පෙනේ. එය වනාන්තරගත කළෝ කවරහු ද? ලෝකයේ ඉහළ ම බෞද්ධ රටේ වාසය කරන හොඳ ම ථේරවාදී බෞද්ධයෝ ය.

එහෙත් උතුමන්ගේ උතුම් චාරිත්‍ර විමසා බලන කල්හි ප්‍රකට වන්නේ ඔවුන් මේ සාරධර්මය තම ජීවිත තුළ මූර්තිමත් කළ බව යි.

අශෝක රජතුමා කාලිංගය ආක්‍රමණය කොට, ඊට පහර දී එය අල්ලාගත්තේ ය.

මේ දරුණු සටනේ දී මහල්ලන්, ස්ත්‍රීන් හා දරුවන් වැටී මැරී ගිය සැටිත් මරණ හයින් බෙරිහන් දුන් සැටිත් සිහිපත් වූ විට අශෝක රජතුමා අසීමිත ශෝකසන්තාපයට පත් විය.

ඔහු බුදුදහමෙහි සිත පහදවාගත්තේත් බුදුසසුන පිරිසිදු කොට ලොව පුරා පතුරුවා හැරීමට ක්‍රියා කළේත් මේ දරුණු පශ්චාත්තාපය නිවාගැනීමට ය.

අශෝක රජුට පින් සිදු වන්ට බුදුසමය උරුම කරගත් ශ්‍රී ලංකාවේ දුටුගැමුණු රජතුමා තමා සමඟ කළ සටනේ දී වැටී මිය ගිය එළාර රජුට මහත් හරසර දැක්වී ය, ක්ෂත්‍රියවංශික රජෙකුට උචිත වන පරිදි මිය ගිය එළාරගේ ආදාහනය මහත් හරසරින් සිදු කරන ලදි. ඔහුගේ සොහොන ද ප්‍රතිෂ්ඨාපනය කරන ලදි.

එළාර රජුගේ සොහොන පසු කර යන විට තූර්ය වාදන නැවැත්විය යුතු බවටත් වාහනවලින් බැස යා යුතු බවටත් නීතියක් දුටුගැමුණු රජු විසින් පනවන ලදි. ඊට අවුරුදු පන්සියයක් ගිය තැන ද මේ නීතිය උල්ලංඝනය නො කර පිළිපදින ලද බව **මහාවංසයේ** සඳහන් වෙයි.

ඊට පසු ඒ සිරිත කෙතෙක් කල් පැවතිණි ද යන්නට ලිඛිත සාක්ෂි නැත. එහෙත් එය දිගු කල් පවතින්ට ඇති බව නම් සිතිය හැකි ය.

1989 දී ජනතා විමුක්ති පෙරමුණේ නායක විජේවීර රජයේ හමුදා විසින් අල්ලාගෙන ඝාතනය කරන ලදි.

ජනතා විමුක්ති පෙරමුණ කරමින් සිටි අරගළයටත් එම පෙරමුණටත් පක්ෂ ද විපක්ෂ ද යන්න නො තකා පාලිත පීඩිත ජනයා සියල්ලෝ ම මිය ගිය විජේවීර ගැන ශෝකසන්තාපයට පත් වූහ. එම පෙරමුණ මට පනවා තිබූ මරණ වරෙන්තුවෙන් බේරී සිටි මම ද සැබවින් ම ශෝක වීමි. අපි මේ ම්ලේච්ඡ ක්‍රියාව ගැන අපේ විරෝධය ද පළ කළෙමු.

අප එසේ කළේ ඇයි? නො මඟ ගොස් සිටියේ වුව ද විජේවීර පීඩිතයා වෙනුවෙන් පෙනී සිටි නිසා ය.

1959 දී වල්ඇතුන් ඇල්ලීම සඳහා සබරගමුවේ පනාමුරේ දී ඇත්ගාලක් පවත්වන ලදි. බොහෝ අලිඇත්තු ගාලට හසු වූහ. එවිට ''පනාමුරේ ඇත්රජ'' ය යි පසු ව විරුදාවලි ලත් ඇතෙක් තම සගයන් උගුලේ හසු වී ඇති බව දැක ඇති වූ ශෝකයෙන් පතිත වන සෙණයක් මෙන් විත් ගාලට පහර දුනි.

ඔහු මෙල්ල කිරීමට කිසිදු ජගතෙකුට නො හැකි විය. අවසානයේ තබන ලද වෙඩි පහරින් ඇත්රජ වැටී මළේ ය. එවිට එහි රැස් ව සිටි අය ශෝකයෙන් පරිපීඩිත ව කඳුළු සැලූවෝ ය. කවීන්ද්‍ර රූපදේව ආනන්ද රාජකරුණා සූරීහු ද සිය කවිසිත තැළී කඳුළු සැලූවෝ ය. මේ සිද්ධිය අළළා ''පනාමුරේ ඇත්රාජා'' යන ජනප්‍රිය සින්දුව ද රචනා විය.

ඒ සත්පුරුෂයන් ඇත් රජුගේ මරණයෙන් එසේ ශෝක වූයේ මන්ද? ඇත්රජු පීඩනයටත් මරණ තර්ජනයටත් ලක් ව සිටි ස්වජනයාගේ විමුක්තිය සඳහා දිවිහිමියෙන් සටන් කළ හෙයිනි.

මෙනයින් කල්පනා කර බලන කල්හි තමිල් සෙල්වන් සටන් කළේ ද සතුරාගෙන් පරිපීඩිත ව මරණ තර්ජනයට ලක් වී සිටින ස්වජනයාගේ විමුක්තිය උදෙසා නො වේ ද? එසේ නම් ඔහු ඝාතනය කෙරුණු විට ඔකඳ වන්නේ මක් නිසා ද?

ඊට එක ම හේතුව නම් දෙමළ ජනයා යනු මනුෂ්‍යයෝ නො වෙති, අපරාධකාරයෝ ම වෙති යනුවෙන් මවා විහිදුවා තිබෙන ව්‍යාජ විඥානයේ ග්‍රහණයට ජනතාව හසු වී සිටීම යි.

ව්‍යාජ විඥානය යනු යම් දේවල් වසා විදා හැරෙන වහන්තරාවකි. එයින් ඇති තතු වසාලනු ලැබේ.

මේ වහන්තරාව වියනු ලබන්නේ පාලක පන්තියේ දෘෂ්ටිවාදීන් විසිනි. දෘෂ්ටිවාදීහු යනු අදහස් නිපදවන්නෝ ය.

ඔවුහු පාසැල්, විශ්වවිද්‍යාල, පිරිවෙන්, පන්සල්, පල්ලි, කෝවිල්, රූපවාහිනී, ගුවන්විදුලි යනාදි ස්ථානවල නිරත ව වාසය කරන්නෝ ය.

ඔවුහු ගුරු, ආචාර්ය, මහාචාර්ය, භික්ෂු, දේවගැති, පූසාරී, කුරුක්කල්, මාධ්‍යවේදී යනාදි නම්වලින් හැඳින් වෙති.

අතීතය අමතක කළත් පසු ගිය තිස් වසර තිස්සේ ම මේ දෘෂ්ටිවාදීන් ඉහත කී දෘෂ්ටිවාදය නමැති වහන්තරාව වියා ජනමනස් වසා විදා හැර ඇත.

මේ දෘෂ්ටිවාදය අනුව දෙමළ ජනයා නම් සිංහලයන්ගේ සතුරෝ ය, ත්‍රස්තවාදියෝ ය, මිනීමරුවෝ ය, තිරිසනුන් වැන්නෝ ය.

දෙමළ විමුක්ති කොටි සංවිධානය මේ තිරිසන්සම මිනිසුන්ගේ සන්නද්ධ බළකාය යි. තමිල් සෙල්වම් මේ බළකායේ සිවිල් ප්‍රකාශකයා ය.

මේ අනුව ඔහු මරාදැමීම වැරදි නැත. එය සිංහලයාගේ යහපත තකා කරන ලද සත්ක්‍රියාවකි.

එසේ හෙයින් ඔහු මරා දැමූ කල රතිඤ්ඤා පත්තු කර, රබන් ගසා ඔකඳ වීම ද සත්ක්‍රියාවකි.

පුවත්පත්, රූපවාහිනී, ගුවන්විදුලි යනාදිය මඟින් දිනපතා ප්‍රචාරය කර හැරෙන මේ දෘෂ්ටිවාදය ජනමනස කෙතරම් තදින් ග්‍රහණයට ගෙන ඇද්ද යනු මෙයින් නො පෙනේ ද?

ව්‍යාජ විඥානය ජනමනස ඩැහැගන්නා සැටි ''සුපර් ස්ටර්'' තරඟයේ දී ද දිස් විය.

මේ ව්‍යාජ දෘෂ්ටිවාදයට එරෙහි ව කම්කරු පන්තියේ සමාජවාදී දෘෂ්ටිවාදීන් මෙලෙස තර්ක කළ යුතු ය,

ශ්‍රී ලංකාවේ සිංහල, දෙමළ, මුස්ලිම් යනුවෙන් ජනවර්ග තුනක් ඇත. මේ ජනවර්ග තුනට ම සමාන අයිතිවාසිකම් ඇත.

න්‍යාය එසේ වුවත් භාවිතය මීට පටහැනි ය. 1948 නිදහස ලත් දා සිට සිංහල ධනපතියෝ නිදහස තනියම භුක්ති විඳගෙන එති. දෙමළ ජනයාගේ ප්‍රජාතන්ත්‍රවාදී අයිතිවාසිකම් හා මානව හිමිකම් නැති කරන ලදි.

මේ සිංහල ධනපති පන්තිය කලින් කලට දෙමළ ජනයාට මැරයන් ලවා පහර දෙවා දෙමළ ජීවිත ද ගේදොර ද දේපොළ ද මහා පරිමාණයෙන් වනසා දැමූහ.

බොහෝ දීර්ඝ කාලයක් තිස්සේ දෙමළ දේශපාලනඥයෝ තම ප්‍රජාතන්ත්‍රවාදී හා මානව හිමිකම් ලබා දෙන ලෙස ඉතා ප්‍රජාතන්ත්‍රවාදී ලෙස, ඉතා ධාර්මික ලෙස ඉල්ලා සිටියෝ ය. ඒ සැම විට ම සන්නද්ධ බලයෙන් ඔවුන්ට මර්දනය එල්ල කරන ලදි.

දෙමළ තරුණයන් අවි ගෙන රාජ්‍යතන්ත්‍රයට පහර දෙන්ට තීරණය කළේ මෙලෙස ඒ සියලූ ප්‍රජාතන්ත්‍රවාදී ව්‍යාපාර අසාර්ථක වීමෙන් පසු ව ය.

දෙමළ විමුක්ති කොටි සංවිධානය යනු මේ තරුණයන්ගේ සන්නද්ධ සංවිධානය යි. තමිල් සෙල්වන් එහි සිවිල් ප්‍රකාශකයා ය. ඔහු මරා දැමීම සන්නද්ධ බලයෙන් දෙමළ ජනයා මර්දනය කිරීමේ වැඩසටහනේ පෙරට තැබූ තවත් පියවරකි. මෙය පීඩිත දෙමළ ජන කොටස ලත් පරාජයකි.

මෙලෙස සලකා බලන විට තමිල් සෙල්වන්ගේ මරණය පීඩිත ජනයාගේ උද්දාමයට නො ව බලවත් ශෝකයට හේතු විය යුතු සිද්ධියකි.

පීඩිත ජනයා පීඩකයන්ට පහර දෙන්නේ යම් තැනෙක ද සියලූ පීඩිතයන් පීඩකයන්ට එරෙහි ව සටන් වදින ඒ පීඩිත ජනයාගේ පැත්තේ සිටිය යුතු ය.

සාමාන්‍ය සටන්කරුවෙකු ලෙස දෙමළ විමුක්ති කොටි සංවිධානයට බැඳුණු තමිල් සෙල්වම් සිය ශූරවීර ක්‍රියා හේතු කොටගෙන අනුක්‍රමයෙන් සංවිධානය තුළ ඉහළ නැඟ ආබාධිත වීමෙන් ද පසු එම සංවිධානයේ දේශපාලන අංශ නායක ධුරයට පත් විය.

මේ ධුරය හොබවන අතර ඔහු සාම සාකච්ඡාවලට සහභාගි වී තිරසර ව ක්‍රියා කළේ ය. විදේශීය ආගන්තුකයන් සමඟ ඔහු පැවැත්වූ සාකච්ඡා ඉතා ශූර ද දෙමළ විමුක්ති අරගළයට හිතකර ද විය.

ලොව සියලූ පීඩිතයන්ගේ පැත්තේ සිට සොවින් බර ව අපි ඔහුගෙන් සදහට ම සමු ගනිමු.

2

ගිය සතියේ දී ජනතා විමුක්ති පෙරමුණ රැකියා විරහිත උපාධිධාරීන් රැ වැට්ටවූ වළෙහි දවල් ද වැට්ටවී ය.

එය මෙසේ කළේ වරක් පාවා දුන් ගුරු වැටුප් සටන යළිත් පාවා දීමත් සමඟ ම ය.

පළමු වර ජ.වි.පෙ. ආණ්ඩුව ද සමඟ එක් ව ගුරු සටන පාවා දුන්නේ ය. රක්ෂිත බන්ධනාගාරගත වීමට අදිටන් කරගෙන සිටි ගුරු සංගම් නායකයන් වෙනුවෙන් ජනාධිපති කාර්යාලයෙන් ම එවූ බව කියන රු. 250,000 (දෙලක්ෂ පනස්දහසක්) ඇප දී සටන පාවා දෙන ලදි.

මෙවර ඇමති සමඟ පැවති සාකච්ඡාවේ දී ගුරු සංගම් දෙකක නියෝජිතයන් නැඟිට එද්දී ජ.වි.පෙ. ආනුභාවය යටතේ පවතින ගුරුසංගම් තුනක නියෝජිතයෝ ගුරු සටන අත් හැර දැමීමට පොරොන්දු වූහ. මෙලෙස ජ.වි.පෙ. දෙවෙනි වර ද ගුරු සටන පාවා දුනි.

ඇමති පොරොන්දු දෙයි. සංගම් ආපසු යයි. පොරොන්දු කැඩෙයි. යළිත් සටන් උණුසුම නැඟෙයි. යළිත් ඇමති පොරොන්දු දෙයි. සංගම් නිහඬ වෙයි.

මේ කල් මැරීමේ ක්‍රමය ගුරු සංගම්වල සටන්කාමය දිය කර හැරීමට ඉතා ම බලවත් ක්‍රමය යි.

රැකියා නැති උපාධිධාරීන් ගමනින් ගමන කොළඹට ගෙන්වා පොලිසිය ලවා ඔවුන්ගේ ඔළු පැළවීම උපාධිධාරී සටන දිය කර හැරීමේ හොඳ ම ක්‍රමය යි.

ජ.වි.පෙ. දැන් අනුගමනය කරන මේ දෙබිඩි, දෙපිටකාට්ටු පිළිවෙත කම්කරු/පීඩිත ජනතාවට අතිශයින් මාරක වේ.

වරක් කඳුළුගෑස් කා, ඔළු පළාගෙන ආපසු ගිය උපාධිධාරීන් මෙවර ද කොළඹට ගෙන්වා ඔවුන්ගේ ඔළු පළවන ලද්දේ සටන්කාමී උපාධිධාරීන්ගේ කොන්ද බිඳීම ම සඳහා ය. ඔවුන්ට රජය ලවා මෙලෙස සංග්‍රහ කරවන්නේ ම ඔවුන් අධෛර්යවත් කර ඔවුන්ගේ රැකියා සටන දිය කර හැරීමට ම ය.

ජ.වි.පෙ. ධනපති පාලනය රැක දීම සඳහා තම ග්‍රහණය යටතේ සිටින කම්කරු සංගම් ද ශිෂ්‍ය සංගම් ද උපාධිධාරී සංගම් ද ඉත්තන් බවට පත් කරගනී.

මේ උපාධිධාරීන් මේ වර පෙළපාළියෙන් ගියේ මුදල් අමාත්‍යංශය දෙසට ය. එසේ කරන ලෙස ඔවුන්ට උපදෙස් දුන්නේ ජ.වි.පෙ. නායකත්වය යි.

අයවැය වාර්තාව ළඟ එන නිසාත් එයට තම සහයෝගය අවශ්‍ය නිසාත් ආණ්ඩුව මේ ප්‍රශ්නය විසඳනු ඇතැයි ද එයින් අයවැයට ඡන්දය දීම සඳහා තම අත් ශක්තිමත් වේ යැයි ද මේ ගර්දභ නායකත්වය සිතී ය. මේ උත්තරීතර චින්තනයේ ක්ෂණික ප්‍රතිඵලය වූයේ කිම? උපාධිධාරීන්ගේ ඔළු පැළී යෑම යි.

දැන් ජ.වි.පෙ. උපාධිධාරීන්ට තවත් රාජ ලණුවක් කවා ඇත. එනම්, මානව හිමිකම් කොමිසම වෙත යන ලෙස උපාධිධාරීන්ට නියම කොට ඇත. කුමට ද? රැකියා ඉල්ලන්ට ය.

රැකියා දීමේ හැකියාවක් මානව හිමිකම් කොමිසමට නැත. එපමණක් නො ව මේ කොමිසම දෙන තීන්දු ක්‍රියාත්මක කිරීමට ආණ්ඩුව ද බැඳී නැත.

එසේ නම් උපාධිධාරීන් මේ වංකගිරියේ දැක්කීමේ තේරුම කුමක් ද? ඔවුන් හෙම්බත් කොට සටන දිය කර හැරීම යි.

විශ්වවිද්‍යාල සිසුන් හා රැකියා නැති උපාධිධාරීන් සිටින්නේ ජ.වි.පෙ. ග්‍රහණය යටතේ ය.
මේ ග්‍රහණයෙන් ගැලවෙන තුරු ඔවුන්ට යහපතක් සිදු නො වේ.
ජ.වි.පෙ. නායකත්වය ධනපති ගැති, කම්කරු-පීඩිත විරෝධී ද්‍රෝහී හැතිකරයකි.

මුලට